# 10 ශ්‍රේණිය

# පුරවැසි අධ්‍යාපනය

## ඡන්ද කොට්ඨාස ක්‍රමය



අන්තර්ගතය - A M R W S අමරතුංග - ගුරු උපදේශක - රත්නපුර අධ්‍යාපන කලාපය
සැකසුම - P G W ගුණතිලක - බප/කළු/ හිනටියන්ගල සිරි සීවලි මහා විද්‍යාලය , කළුතර

## ඡන්ද කොට්ඨාස ක්‍රමය

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් වඩාත් සාර්ථක කර ගැනීම සඳහා ඡන්ද කොට්ඨාස අනුව ජනතා නියෝජිතයින් තෝරා පත්කර ගැනීම කළ හැකිය. එහිදී සමස්ථ ශ්‍රී ලංකාවම පලාත් පාලන කොට්ඨාස, පළාත්, දිස්ත්‍රික්ක වශයෙන් ඡන්ද කොට්ඨාස වලට වෙන් කර ඇත.

| | |
|---|---|
| පළාත් පාලන කොට්ඨාස | → පළාත් පාලන මැතිවරණ |
| පළාත් වශයෙන් | → පළාත් සභා මැතිවරණ |
| දිස්ත්‍රික්ක වශයෙන් | → පාර්ලිමේන්තු මැතිවරණ |
| ශ්‍රී ලංකාව එක කොට්ඨාසයක් ලෙස සලකමින් | → ජනාධිපතිවරණය |

ඡන්ද කොට්ඨාස බෙදීමේදී භූමි ප්‍රමාණය හා ජනගහණය පිළිබඳව සැලකිලිමත් වේ.

## ක්‍රියාකාරකම : -

දී ඇති දිස්ත්‍රික් සිතියමේ පළාත් සභා මායිම් ලකුණු කරන්න.

## ක්‍රියාකාරකම : -

පහත වගුව සම්පූර්ණ කරන්න.

| පළාත් සභාවේ නම | අයත් වන දිස්ත්‍රික්ක |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |



# ඡන්ද කොට්ඨාස බෙදා මැතිවරණ පැවැත්විම.

- සමාජයේ විවිධ බෙදීම් නොසලකා සියලු දෙනාගේ පොදු මතයට අනුව ක්‍රියාත්මක විය හැක.
- සම්පත් බෙදී යාම ක්‍රමවත් වේ.
- දේශපාලන ක්‍රියාවලියට අවශ්‍ය ප්‍රාදේශිය නායකයින් තේරීම
- තම කොට්ඨාසයට වග කියන නියෝජිතයෙකු තෝරා ගැනිමට හැකිවේ.
- සංවර්ධන ක්‍රියාවලිය පහසුකරයි.

## නිදහස් හා සාධාරණ මැතිවරණ

ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්නට අත්‍යවශ්‍ය සාධකයකි. මැතිවරණ පැවැත්වීම, මැතිවරණ මගින් පාලනයට ජනතා නියෝජිතයින් පත්කර ගැනීමට ඉඩ ලැබේ. මැතිවරණ පැවැත්වන ක්‍රමයද මෙහිදී වැදගත් වේ. ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් සාර්ථක වීමට මේ මැතිවරණය නිදහස් හා සාධාරණ වීම අත්‍යවශ්‍ය වේ.

**මැතිවරණය නිදහස් හා සාධාරණ මැතිවරණයක් වීමට නම් :-**

- නියමිත සුදුසුකම් ඇති ඕනෑම පුරවැසියෙක්ට ඡන්ද දායක හෝ ඡන්ද අපේක්ෂකත්වය ලබා ගත හැකි වේ.
- නියමිත කාලය තුලම මැතිවරණය පැවැත්විය යුතුය.
- ඡන්ද දායකයන්ට මැතිවරණ කාර්යයන්ට නිදහසේ සම්බන්ද වීමට ඉඩකඩ ලබා දිය යුතුය.
- මැතිවරණ නීතිරීති උල්ලංඝනය විය නොහැකිය.
- මැතිවරණය සාමකාමී විය යුතුය.

**ආණ්ඩු පක්ෂය**

පාලන ආයතනයක් සඳහා නියෝජිතයින් තෝරා පත්කර ගැනිමට පැවැත්වෙන ඡන්ද විමසීමකදී බහුතර නියෝජිතයින් තේරී පත්වූ පක්ෂය හෝ කණ්ඩායම පාලන බලය හිමිකර ගනී. එය ආණ්ඩු පක්ෂයයි.

**විරුද්ධ පක්ෂය**

මැතිවරණයකදී ආණ්ඩු පක්ෂයට වඩා අඩු නියෝජිත සංඛ්‍යාවක් තෝරා ගත් පක්ෂය හෝ කාණ්ඩායම විරුද්ධ පක්ෂය ලෙස හඳුන්වයි.

රටක පාලන තන්ත්‍රය තුළ විරුද්ධ පක්ෂයට සුවිශේෂී කාර්ය භාරයක් හිමිවේ.

## විරුද්ධ පක්ෂයේ කාර්යය

- ආණ්ඩු පක්ෂයේ යහපත් කටයුතු සාර්ථක කර ගැනිමට සහය විම.
- ආණ්ඩු පක්ෂයේ කටයුතු සොයා බලා සංවර්ධනාත්මක විවේචන ඉදිරිපත් කිරිම.
- වඩාත් යහපත් ආණ්ඩුවක් පිහිටුවිමට කටයුතු කිරිම.
- ප්‍රජාතන්ත්‍ර විරෝධි කටයුතු වලදි විරෝධය ප්‍රකාශ කිරිම.

**<u>ක්‍රියාකාරකම</u> : -**

ශ්‍රී ලංකාවේ පළමු මැතිවරණයේ සිට වර්තමානය දක්වා සිටි ආණ්ඩු පක්ෂයේ නායකයින් හා විරුද්ධ පක්ෂ නායකයින් ලියා පහත වගුව සම්පූර්ණ කරන්න.

| පක්ෂය | ආණ්ඩු පක්ෂ ප්‍රධානින්ගේ නම සහ කාලය | විරුද්ධ පක්ෂ නායකයින්ගේ නම සහ කාලය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |